# අත් හෝඩියේ යාළුවා



ශෂිනි යසස්මි ජයරත්න

# අත් හෝඩියේ යාළුවා


## ශෂිනි යසස්මි ජයරත්න

කතෘ

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
6 ශ්‍රේණිය C


2026


ප්‍රකාශිත දිනය 2026-05-10

**ISBN 978-624-211-491-0**

# ~ පිදුම ~

මහනුවර මහාමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමිය වන ශශිකලා සේනාධීර මියටත්, ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක, සෙනෙවිරත්න මහලේකම් සර්ටත්,

6-C පංතියේ පංතිභාර ගුරුතුමියටත්, අංශභාර ගුරුතුමියටත් මෙම අවස්ථාව ලබා දීමට කටයුතු කිරීම පිළිබඳව මගපෙන්වීමත් වෙනුවෙන් ගෞරවනීය ස්තුතිය.

මා ඉගනගත් මහාමායා බාලිකා විද්‍යාලයේ අකුරු කියාදුන් සියලුම ගුරුවරුන්ට යහළුවන්ට මේ කුඩා උත්සාහය ආදරයෙන් පිදේ..



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර,

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා
විද්‍යාලය.

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව



නෙයාට අවුරුදු අටයි. එයාගේ ලොකුම පුරුද්ද රෑට ජනේලෙන් එළිය බලන එක. අම්මා නිදාගන්න කිව්වත් නෙහා නිදාගත්තේ නෑ. එයා තරු එක්ක කතා කරනවා. "අද ඉස්කෝලෙදි පන්තියේ යාලුවෝ මට හිනා වුණා තරුවේ". මට ගණන් වරදුනාට මම අඬන්නේ නෑ. හෙට හරියට කරනවා. නෙයා කියනවා. ආච්චි කියනවා අහසේ මුකුත් නෑ  ළමයෝ. කාත් එක්කද ඔය කතා කරන්නේ කියලා... හැබැයි නෙයා දන්නවා තරු  එයා කියන දේ අහනවා කියලා



ඉස්කෝලෙදි මැඩම් කිව්වා විද්‍යා ප්‍රදර්ශනයට තමන් කැමති දෙයක් කරන්න කියලා. හැමෝම එක එක ඒවා කරනවා කියලා. යාලුවෝ කියනවා.

නෙහාට මොකුත් අදහසක් ආවේ නෑ. ඇ වෙනකන් ඉඳලා තරුවලින් ඇහුවම මොකද කරන්නේ තරුවේ. මට මොකුත් හිතාගන්න බෑ.

ඊට පස්සෙ දවසේ පන්තියට අලුත් යාළුවෙක් ආවා.. එයාගෙ නම සුහාරා. එයාට කතා කරන්න බැහැ. ඇහෙන්නෙ නෑ.

ළමයි එයාට හිනා වුණා.

විවේක කාලෙදිවත් කවුරුත් එයා ළඟට ගියේ නෑ.

මම ගිහින් එයා එක්ක යාළු වුණා. එයා ගොළුයි කියලා නෙහා දැනගත්තා.



නෙයාට මතක් උනා තරුවලට එයා කියන දේ. "කවුරුත් ඇහුම්කන් දෙන්නේ නැති වෙලාවට, කතා කරන එක අමාරුයි". YouTube එකෙන් ගොලු අය එක්ක කතා කරනවා බලල තියෙන නිසා සුහාරාට අත්දෙකෙන් Hi කියලා



පෙන්නුවා. සුහාරා හිනා වුණා. එයා නෙයාට Friend කියලා පෙන්නුවා.

එදා ඉඳන් නෙයා සුහාරයි. Best friendsලා උනා. විවේක කාලයේදී සුහාරා නෙයාට අත් හෝඩියේ ඉගැන්වුවා.

එයා අඳින මල් සමනල්ලු හරි ලස්සනයි. ක තා කරන්න බැරි උනාට සුහාරා චිත්‍රවලට දක්ෂයි.

විද්‍යා ප්‍රදර්ශනය ලං උනා. හැමෝම අහනවා "නෙයා මොන project එකද?" කියලා. නෙයා හිතලාවත් නෑ.

එක රැක තරුවක් හරි දිලිසෙනවා දැක්කේ. නෙයාට අදහසක් ආවා.



ප්‍රදර්ශන දවසේ නෙයා ගෙනාවේ ලොකු chart එකක්. ඒකේ ඇඳලා තිබ්බේ "නිහඬ වචන". අත් වලින් කරන සංඥා 9 ක් එයා ලස්සනට අඳලා,
පහළින් සිංහලෙන් තේරුමත් ලියලා තිබ්බා.

"Hi = ආයුබෝවන්,
Thank you = ස්තූතියි,
Friend = යාළුවා,
I hear you = මම ඔයාව අහනවා"



සුහාරා stage එක උඩ ඉඳන් හැමෝටම ඒ සංඥා පෙන්නුවා. නෙයා පහළ ඉඳන් ඒවා සිංහලෙන් කිව්වා. මුළු hall එකම නිහඬ උනා. ඊට පස්සේ මාර අත්පොලසනක් ආවා.

මැඩම් ඇවිත් ඇහුවා "මේක හිතාගත්තේ කොහොමද පුතේ?"

නෙයා බය උනා. ඊට පස්සේ කිව්වා "මාත් එක්ක කතා කරන තරුවක් ඉන්නවා. එයා කිව්වා, කවුරුත් ඇහුම්කන් දෙන්නේ නැති කෙනෙක්ට කතා කරන එක තමයි ලොකුම විද්‍යාව කියලා".



මුළු පාසලටම සුභාරායි නෙයායි වීරයෝ උනා. හැබැයි නෙයා දන්නවා ඇත්ත වීරයා කවුද කියලා. ඒ සුභාරා. එයා අත් වලින් ලෝකෙට කතා කරපු නිසා.

ඒදා රෑ නෙයා ආපහු ජනේලෙන් එළිය බැලුවා. තරුවක් හරි ලස්සනට දිලිසෙනවා දැක්කා.
"අද මම වීරයෙක් උනා තරුවේ. පොඩි එකක්. හෙට ලොකු එකක් වෙනවා" නෙයා කොඳුරලා නිදාගත්තා.
ටික වෙලාවකට පස්සේ තව තරුවක් දැල්වුනා වගේ නෙයාට දැනුනා. හරියට හිනාවක් වගේ.

වීරකම කියන්නේ ලොකු සම්මාන දිනන එක නෙවෙයි. කවුරුත් නොදකින සුහාරා වෙග් කෙනෙක් ළඟට ගිහින් "මම ඔයාව දකිනවා" කියලා හිතවත් වෙන ඒක. වචන නැතුවත් කතා කරන්න පුළුවන්. අත් දෙකකින්, හිනාවකින්, ඇහුම්කන් දෙන හිතකින්.

අපි අනිත් අය ගැනත් හිතමු.

# නිමි



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-211-491-0